Department of Education,Sabaragamuwa Province/ Weekly School

## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

ශ්‍රේණිය - 10

විෂය - කෘෂි හා ආහාර තාක්ෂණය

සතිය - අගෝස්තු 01 සතිය

01) 10 ශ්‍රේණියේ කෘෂි විද්‍යාව හදාරණ සිසු පිරිසක් ව්‍යාපෘතියක් ලෙස තවාන් පැල නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වේ. ඒ මගින් ප්‍රායෝගික දැනුම මෙන්ම කෘෂි ව්‍යවසායකත්වයට ද යොමු විය හැකි බව විදුහල්පතිතුමාගේ ද අදහස විය.


1. (අ) තවානක් සඳහා සුදුසු ස්ථානයක තිබිය යුතු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
   (ආ) මෙම සිසුන් තෙත් කලාපයට සුදුසු සහ වියළි කලාපයට සුදුසු පරිදි තවාන් දෙවර්ගයක් නිර්මාණය කරන ලදී. එම පාත්ති දෙක කුමක් විය හැකිද ?

2. (අ) ගිල්වූ තවාන් පාත්ති සැකසීමේදී විශේෂිත පියවරක් ලෙස පතුල සහ පැති ආවරණය වනසේ සිදුරු කීපයක් සහිත පොලිතීනයක් අතුරා ගනු ලබේ. මීට හේතුවක් ලියන්න.
   (ආ) පරිසර හිතකාමී බඳුන් වර්ග තෝරා ගැනීමට එම සිසුන් අවධානය යොමු කළ අතර ඒ සඳහා යොදාගත් බඳුන් වර්ග 2ක් ලියන්න.

3. තවාන් මිශ්‍රණයක තෙතමන තත්වය පරීක්ෂා කිරීමට භාවිතා කළ හැකි සරළ පියවර කුමක්ද ? එහිදී ඔබට එළඹිය හැකි නිගමනයක් ලියන්න.

02) ජලය සීමිත සම්පතක් වන බැවින් එය මතු පරපුර වෙනුවෙන් මානව කළමනාකරණය කළ යුතු වන අතර අතීතයේ ද ජල කළමනාකරණය කෙරෙහි ඉහළ අවධානයක් තිබූ බවට සාක්ෂි ඇත.

ජල සම්පාදන ක්‍රමයක රූප සටහනක් පහත දැක්වේ.



1. (අ) මෙම රූපයෙන් පෙන්වන ජල සම්පාදන ක්‍රමය නම් කරන්න.
   (ආ) එහි වාසි දෙකක් හා අවාසි දෙකක් ලියන්න.
   (ඉ) මෙම ක්‍රමයෙන් ජලය සැපයිය හැකි බෝග වර්ග 4ක් නම් කරන්න.

2. (අ) ජල වාහන ක්‍රම 2ක් දක්වන්න.
   (ආ) ජල වහන කාණු රටා පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න.

3. දුර්වල ජල වහනයක් සහිත පසක දක්නට ලැබෙන බෝග වගාවට අහිතකර ලක්ෂණ දෙකක් ලියන්න.